සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** ඩී.එම්. ෆුඩ්ස් සෞඛ්‍යාරක්ෂිතව පලතුරු යුෂ සැකසුම් කරනු ලබන දේශීය සමාගමකි. එම සමාගම දේශීය වැවිලිකරුවන්ගෙන් විවිධ පලතුරු වර්ග සපයාගනු ලබන අතර එම සැපයුම සෘතුමය තත්ත්ව අනුව රඳා පවතී. ආකර්ෂණීය ඇසුරුම්කරණයෙන් සහ පාරිභෝගික රුචියට සරිලන විටමින් අඩුන රසයන් එක් කිරීම තුළින් ඩී.එම්. ෆුඩ්ස් තම නිෂ්පාදිතයන්ට අගය එකතු කරයි. සමාගමේ කළමනාකරුවන් එහි සැපයුම්කරුවන්, සුපිරි වෙළෙඳසැල් සහ සේවකයින් අතර සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනී. මේ අතර, නව පලතුරු යුෂ නිෂ්පාදකයින් වෙළෙඳපොළට ප්‍රවේශවීමත් සමග ඩී.එම්. ෆුඩ්ස් සමාගමෙහි පවතින තරගකාරීත්වය වැඩි විය.

(i) (අ) ඉහත සමාගම ඉටු කරනු ලබන මානව අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සමාගමේ නිෂ්පාදිතවල අගය එකතු කිරීම තුළින් එම සමාගමේ ලාභයට සිදුවන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සුපිරි වෙළෙඳසැල්වල තම නිෂ්පාදිත අලෙවි කිරීමෙන් ඉහත සමාගමට අත්කර ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ඩී.එම්. ෆුඩ්ස් සමාගම, වැවිලිකරුවන් සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඉහත සමාගමේ අභ්‍යන්තර පාර්ශ්වකරුවන් **දෙදෙනකු** නම් කර, එම එක් එක් පාර්ශ්වය සමාගමේ කටයුතු කෙරෙහි ඇල්මක් දක්වන්නේ ඇයි දැයි හේතුව බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සිද්ධියේ ආසන්න පරිසරයට අයත් පාර්ශ්ව **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සෘතුමය විචිධත්වයේ ප්‍රතිඵලයක් ලෙස පලතුරු සැපයුම උච්චාවචනය වීම නිසා ඩී.එම්. ෆුඩ්ස් සමාගමට මුහුණදීමට සිදු වන තර්ජනයක් හා ලබාගත හැකි අවස්ථාවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සෞඛ්‍යාරක්ෂිතව තම නිෂ්පාදිත සැකසුම් කිරීම තුළින් ඩී.එම්. ෆුඩ්ස් සමාගමට අත්විය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි))

(v) (අ) තම දේශීය වැවිලිකරුවන් වෙනුවෙන් ඩී.එම්. ෆුඩ්ස් සමාගමට ඉටු කළ හැකි වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) පාරිසරික තිරසරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩී.එම්. ෆුඩ්ස් සමාගමට දායක විය හැකි ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** ලිඛිත ගිවිසුමකින් තොරව කමල් සහ යසස් විද්‍යුත් උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ආයතනය තම ව්‍යාපාර කටයුතු ජාත්‍යන්තර වෙළෙඳපොළ දක්වා පුළුල් කිරීමට රජයෙන් සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. වසර කිහිපයකට පසුව, යසස් තම ආයෝජන කොටස ආපසු ලබාගනිමින් හවුල්කාරීත්වයෙන් ඉවත් විය. ඉන්පසුව, මෙම ව්‍යාපාරය කේවල ස්වාමි ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන ලදී. මේ අතරතුර, විද්‍යුත් උපකරණ කර්මාන්තයට ඉහළ බදු බර, දැඩි තත්ත්ව ප්‍රමිතීන් සහ ශ්‍රම පිරිවැයෙහි ඉහළ යාම වැනි විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

(i) (අ) ඉහත ව්‍යාපාරයේ නිෂ්පාදිත ජාත්‍යන්තර වෙළෙඳපොළ දක්වා පුළුල් කිරීමට රජයෙන් ලබාගත හැකි උපකාරක සේවාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ව්‍යාපාරයෙන් රජයට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

[දෙවැනි පිටුව බලන්න.

CamScanner

(ii) (අ) මෙම හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ කුමන පදනම මත හවුල්කරුවන් අතර බෙදාගත යුත්තේ දැයි හේතුවක් සපයමින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) විද්‍යුත් උපකරණ කර්මාන්තයට රජය විසින් දැඩි තත්ත්ව ප්‍රමිතීන් පැනවීමෙන් පාරිභෝගිකයින්ට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) හවුල් ව්‍යාපාරය කේවල ස්වාමි ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමෙන් කමල්ට අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර නාම ආඥා පනත යටතේ කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි නොකිරීමෙන් ව්‍යාපාරයට ඇතිවන අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) කමල් තම ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට අදහස් කරන්නේ නම්, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අත්‍යවශ්‍ය ලේඛන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) කමල්ට ඔහුගේ විද්‍යුත් නිෂ්පාදිත පරිසර හිතකාමී ලෙස නිෂ්පාදනය කළ හැකි ආකාර **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රම පිරිවැය වැඩිවීම තුළින් නිෂ්පාදන පිරිවැයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා කමල්ට අනුගමනය කළ හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

3. නදීෂා විසින් විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ වර්ධනයත් සමග ඇය සේවකයන් පස්දෙනෙකු බඳවාගත් අතර, නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකමක් තුළින් ස්වයංක්‍රිය යන්ත්‍රයක්ද මිල දී ගනු ලැබී ය. මේ අතරතුර, නදීෂා විසින් තම නිෂ්පාදිතවල නීතිමය ආරක්ෂාව සහතික කර ගැනීම සඳහා වෙළෙඳ ලකුණ ලියාපදිංචි කරන ලදී. එසේ ම ඇය තම ඉතුරුම්, කොටස් වෙළෙඳපොළෙහි සහ ඒකකභාරයක ආයෝජනය කරන ලදී.

(i) (අ) ව්‍යවසායකයකු ලෙස නදීෂාට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක විය හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නදීෂාගේ මෙම ව්‍යාපාරය සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස වර්ග කිරීමට අදාළ වන ඉහත සිද්ධියෙහි ඇතුළත් නිර්ණායකයක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට වඩා බැංකුවක ඉතිරි කිරීම තුළින් නදීෂාට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබා ගැනීමෙන් නදීෂාට සිදු විය හැකි අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) තම ව්‍යාපාරය පුළුල් කිරීමේදී නදීෂාට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නදීෂාට ඇගේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා සහාය ලබාගත හැකි බැංකු හැර වෙනත් රාජ්‍ය ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ඒකකභාරවල ආයෝජනය කිරීමෙන් නදීෂාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) තම ව්‍යාපාරය ස්වයංක්‍රීයකරණය කිරීම තුළින් නදීෂාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'වෙළඳ ලකුණ' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) තම නිෂ්පාදිතවල වෙළෙඳ නාමය ලියාපදිංචි කිරීමෙන් නදීෂාට ලැබිය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) සාමාන්‍ය රක්ෂණයෙන් ව්‍යාපාරයකට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවෙන් (SLECIC) අපනයනකරුවන්ට ලබාදෙන සේවා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'ක්‍රම කාර්ය සම්පාදනය (Logistics)' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ක්‍රම කාර්ය සම්පාදන කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් අතර ඇති වෙනස්කම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සෘජු හා වක්‍ර බෙදාහැරීම් මාර්ග අතර ඇති වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

[තුන්වැනි පිටුව බලන්න.



Past Papers Wiki
CamScanner

(iv) (අ) ජාත්‍යන්තර වෙළෙඳාමේදී ප්‍රභවස්ථාන සහතිකය භාවිතයෙන් ආනයනකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) බලය නොලත් මාර්ග ඔස්සේ ජාත්‍යන්තරව මුදල් යැවීමෙන් රටකට සිදුවිය හැකි අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) රටක් විසින් වෙනත් රටකට වෙළෙඳ සම්බාධක පැනවීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ආනයන සීමා කිරීමට රජය විසින් පනවනු ලබන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පාලන ක්‍රමය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

5. ෆ්‍රන්ට් ලයින් ප්ලාස්ටික් බෝතල් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කළමනාකරු විසින් නාස්තිය අවම කිරීමට සහ දෛනික නිෂ්පාදන පරිමාව බෝතල් 7 500 සිට 10 000 දක්වා වැඩි කිරීමට සැලසුමක් පිළියෙල කර ඇත. කළමනාකරණය, ඉහළ සිට පහළට අඛණ්ඩ නියෝග දීමේ දාමය භාවිත කරන අතර තීරණ ගැනීමේ දී සේවක සහභාගීත්වය වර්ධනය කරලීමට උනන්දු කරවයි. කෙසේ වුවත්, දුර්වල තොග පාලන පද්ධතිය හේතුවෙන් තොග හිඟය සහ නිෂ්පාදන ප්‍රමාදයන් ඇති විය.

(i) (අ) නාස්තිය අවම කිරීම තුළින් ෆ්‍රන්ට් ලයින් ආයතනයට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ප්ලාස්ටික් බෝතල් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'නියෝග දීමේ දාමය' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) කළමනාකරණය විසින් යොදාගනු ලබන ඉහළ සිට පහළට නියෝග දීමේ ප්‍රවේශයේ වාසියක් සහ අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සහභාගිත්ව නායකත්ව ශෛලිය, සේවක අභිප්‍රේරණය සඳහා බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) තීරණ ගැනීමේ දී සේවක සහභාගිත්වය උනන්දු කරලීම තුළින් ආයතනයට ඇතිවන අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) දුර්වල තොග පාලනයට හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ප්‍රමාදය හේතුවෙන් ෆ්‍රන්ට් ලයින් ප්ලාස්ටික් බෝතල් ව්‍යාපාරයට සිදුවන අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) පවත්නා සම්පත් ධාරිතාව තුළ නිෂ්පාදන මට්ටම බෝතල් 10 000ක දක්වා ඉහළ නැංවීමට යොදාගත හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනයේ දී 'නිෂ්ක්‍රීය කාලය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

6. ගැමා, දේශීය ටෙලි මාකටින් (telemarketing) සමාගම ජාත්‍යන්තර ව්‍යාපාර හේතුවෙන් දැඩි තරගකාරිත්වයකට මුහුණ දී සිටියි. දිවයින පුරා තම සේවාව පුළුල් කිරීමට සමාගම ඩිජිටල් අලෙවිකරණ ප්‍රවර්ධන වැඩ සටහනක් සමාජ මාධ්‍ය හරහා සිදු කරන ලදී. එයට අමතරව, නිවෙස් වෙත තම නිෂ්පාදන බෙදාහැරීම සඳහා පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වාදෙන ලදී. තවද, ගැමා සමාගම සේවාව කඩිනම් කිරීම සඳහා බෙදාහැරීමේ රථ මිල දී ගැනීමට වාණිජ බැංකුවකින් ණයක් හෝ ලිසිං පහසුකමක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මේ අතර, සමාගමේ ඉහළ මෙහෙයුම් පිරිවැය හේතුවෙන් මුදල් ප්‍රවාහ ගැටලු ඇති විය.

(i) (අ) ගැමා සමාගම භාවිත කළ අලෙවි මිශ්‍ර උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිවෙස් වෙත බෙදාහැරීම තුළින් ගනුදෙනුකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සමාජ මාධ්‍ය අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් මගින් ගැමා සමාගමට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඩිජිටල් අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් තුළින් මෙම ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)



Past Papers Wiki

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

(iii) පරිසර හිතකාමී ඇසුරුම් මගින් සමාගමේ සන්නාම ප්‍රතිරූපය වැඩිදියුණු වන ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) බෙදාහැරීමේ රථ මිල දී ගැනීම සඳහා වාණිජ බැංකුවකින් ණයක් ලබාගැනීමෙන් ගැමා සමාගමට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගැමා සමාගම කල්බදු පහසුකම් යටතේ බෙදාහැරීමේ රථ මිල දී ගන්නේ නම් මෙහෙයුම් කල්බදු පහසුකමට වඩා මූල්‍ය කල්බදු පහසුකම වඩාත් සුදුසු ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(v) (අ) ගැමා සමාගමේ මුදල් ප්‍රවාහ ගැටලු විසඳා ගැනීමට යොදාගත හැකි උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තම වාහන සමූහයක් පවත්වා ගැනීමට වඩා බෙදාහැරීමේ සේවා බාහිරෙන් ලබා ගැනීමේ වාසියක් සහ අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

7. ව්‍යාපාරයක කළමනාකරණය විසින් සේවකයින් බඳවා ගැනීම සඳහා නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණ (walk-in interview) ක්‍රමයක් සැලසුම් කර ඇත. එමෙන් ම, සේවක අභිප්‍රේරණය සඳහා සමාගම විසින් මනාව සැලසුම් කළ පුහුණු සහ සංවර්ධන වැඩසටහනක් මෙන්ම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් නිර්මාණය කර ඇත. මීට අමතරව, සමාගමේ කළමනාකරණ පාලන පද්ධතිය සහ මානව සම්පත් සැලැස්ම යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇත.

(i) (අ) නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණවලින් ව්‍යාපාරවලට ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණ හැර ඉක්මනින් සේවකයින් බඳවාගත හැකි විකල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) පුහුණු හා සංවර්ධන අවස්ථා ලබා දීමෙන් සේවකයින්ට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයින් සඳහා ප්‍රදානය කළ හැකි මූල්‍යමය නොවන ප්‍රතිලාභ **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සේවක අනුප්‍රාප්තික සැලසුමකින් සමාගමකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම්කරණය අතර ඇති වෙනස උදාහරණයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කළමනාකරණ පාලන පද්ධති යාවත්කාලීන කිරීමෙන් සමාගමට ලැබිය හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'කාර්යමණ්ඩල සැලැස්ම' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(v) තත්ත්ව කළමනාකරණයේ දී යොදාගනු ලබන 'ශූන්‍ය දෝෂ' (Zero defects) ශිල්පීය ක්‍රමයේ ඇති වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) සෙවුම් යන්ත්‍රයක් (Search Engine) යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක සයිබර් ආරක්ෂණ (Cyber security) තර්ජන වළක්වා ගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) විවෘත (Open source) මෘදුකාංග භාවිතයෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පරිගණක පද්ධතියක භාවිත කරනු ලබන ආදාන උපකරණ (input devices) **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා විශාල දත්ත (big data) භාවිත කිරීමේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ස්ථානීය ප්‍රාදේශීය පරිගණක ජාල (LAN) හා පුළුල් ක්ෂේත්‍ර පරිගණක ජාල (WAN) අතර ඇති වෙනස පහදන්න. (ලකුණු 02 යි)

(iv) (අ) පවතින ව්‍යාපාර සැලැස්මක් සංශෝධනය කිරීමට සිදුවන අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලසුම්කරණයේ දී මූල්‍ය පුරෝකථනවල ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'මෙහෙයුම් පෙර වියදම' යන්න නිර්වචනය කර, උදාහරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක් මෙහෙයුම් පෙර වියදම් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම තුළින් අත්වන ප්‍රතිවිපාක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

* * *



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

CamScanner